# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2097/41 - 2018 නොවැම්බර් මස 16 වැනි සිකුරාදා - 2018.11.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* :
එන්සීපී/ටීකේ/9/6/එස්ඕ/2018/86-එන්සීපී/ටීකේ/9/11/එල්සී/10.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොළොන්නරුව ගමේ, අංක. 172, පොළොන්නරුව නගරය සහ කැබලි අංක. 171, තෝපාවැව ග්‍රාම නිලධාරි වසම්වල, මැද පත්තුව සුළු කොට්ඨාසයේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් පොළොන්නරුව දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2018.07.31 දිනැතිව පිළියෙල කරන ලද අවසාන නිරවුල් නගර පිඹුරු අංකය. 3950, අතිරේක අංකය. 216, පත්‍ර අංකය. 221 හි පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0107 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් (05):

1. කැබලි අංක. 2421
ඉඩමේ නම: මිනීපිටිය කැලේ, වරිපනම් අංක. 39; ඉඩමේ විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: - (රංකොත්ගෙදර විමලසූරිය, විමල් ඉලෙක්ට්‍රිකල්ස්, නවනගරය පාර, පොළොන්නරුව විසින් භුක්ති විඳිනු ලබයි, 71 වැනි බිම් කැබැල්ලේ කොටසක්, මාර්ග සංවර්ධන අධිකාරිය වෙත අවශ්‍යව ඇත); ප්‍රමාණය: හෙක්. 0.0004.

2. කැබලි අංක. 2422
ඉඩමේ නම: මිනීපිටිය කැලේ, වරිපනම් අංක. 45; ඉඩමේ විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: - (මූකදන්ගේ රෝහිනී, අංක. 440, පොත්ගුල් පාර, පොළොන්නරුව විසින් භුක්ති විඳිනු ලබයි, 72, 73, 74, 75, 76 සහ 77 වැනි බිම් කැබැලිවල කොටස්, මාර්ග සංවර්ධන අධිකාරිය වෙත අවශ්‍යව ඇත); ප්‍රමාණය: හෙක්. 0.0019.

3. කැබලි අංක. 2423
ඉඩමේ නම: මිනීපිටිය කැලේ, වරිපනම් අංක. 45; ඉඩමේ විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: මූකදන්ගේ රෝහිනී, අංක. 440, පොත්ගුල් පාර, පොළොන්නරුව, (18 (හිපි 253629) වැනි බිම් කැබැල්ලේ කොටසක්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ අත්කර ගන්නා ලදී, අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0024.

4. **කැබලි අංක. 2424**

ඉඩමේ නම: මිනීපිටිය කැලේ, වරිපනම් අංක. 47; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සමීර නිරෝෂ් ගුණසේකර, අංක. 24/6, නිශ්ශංකමල්ල පෙදෙස, නවනගරය, පොළොන්නරුව විසින් භුක්ති විඳිනු ලබයි, (74 සහ 77 වැනි බිම් කැබලිවල කොටස්, මාර්ග සංවර්ධන අධිකාරිය වෙත අවශ්‍යව ඇත); ප්‍රමාණය: හෙක්. 0.0032.

5. **කැබලි අංක. 2425**

ඉඩමේ නම: මිනීපිටිය කැලේ, වරිපනම් අංක. 47; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සමීර නිරෝෂ් ගුණසේකර, අංක 24/6, නිශ්ශංකමල්ල පෙදෙස, නවනගරය, පොළොන්නරුව, (18 (හිපි 253629, හිපි 253631) වැනි බිම් කැබැල්ලේ කොටසක්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ අත්කර ගන්නා ලදී, අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0028.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018.12.17 දින අනුව පෙරවරු 9.30 ට තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2018.12.10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම්,
තමන්කඩුව.

2018 නොවැම්බර් මස 13 වැනි දින,
තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-1303

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.